# ඇනාලා කුමරියගේ මායා දොරටුව



සනූලි රණසිංහ

# ඇනාලා කුමරියගේ මායා දොරටුව

කතාව සහ චිත්‍ර

සනුලි රණසිංහ

කතෘ ප්‍රකාශන

පළමු මුද්‍රණය 08.02.2025

ISBN - 978-624-208-625-5

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡෙද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.
ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **"හෙරණගත්කරණී"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.
මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජිවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

# පිදුම

මාගේ ආදරණීය
ගුරු මෑණියන්
නිල්මිණී වික්‍රමතිලක මහත්මිය
වෙත සාදරයෙන් පිළිගැන්වේ.

මගේ පොතේ
අඩුපාඩු වැරදි නිවැරදි කළ
මාගේ අම්මාටත් තාත්තාටත්
සීයාටත් අත්තම්මාටත්
පවුලේ සැමදෙනාටත්
මම මගේ ස්තුතිය
පුද කරමි.

# පටුන


1. ආසව මොකට ද? 1

2. මායා දොරටුව 4

3. මායාකාරිය 7

4. පරාජය 9

# ආසාව මොකට ද?



ඔන්න එකෝමත් එක රටක හරිම ලස්සන මාලිගාවක් තිබුණා. ඒ මාලිගාවේ ලස්සන කුමරියක් සිටියා. ඇයගේ නම ඇනාලා.

ඇය සිංදු කියන්නට හරිම දක්ෂයි. ඇගේ සින්දු අසන්නට මාලිගාවේම මිනිසුන් ප්‍රිය කරයි. ඒ වගේම ඇය විභාග වලට වැඩිම ලකුණුත් ගත්තා.

ඒ නිසා ඇයගේ අම්මා සහ තාත්තා ඇයට තෑග්ගක් තෑගි කලා. ඇයගේ උපන්දින වලට ඇයගේ අම්මා ඇයට පොත් තෑගි කලා.

ඒ වගේම ඇයගේ අම්මා ඇයට රැට කුමාරියන්ගේ කතන්දර කිව්වා.

එක දවසක් ඇනාලා කුමරිය සිහිනයක් දැක්කා. ඇය මායා දොරටුවකට යනවා. ඊට පසු ඇය මායාකාරියක් පරද්දනවා.

ඊට පසු ඇයට ඇහුනා කවුදෝ කියනවා 'ඇනාලා නැගිටින්න, වෙලාව හරි කියලා'. ඈ නැගිටිද්දී දැක්කෙ ඇයගේ අම්මා ඇයට කතා කරනවා.

ඇය අම්මාට දැක්ක දේ කීවා. ඇයගේ අම්මාටත් අදහා ගන්න බෑ.


ඇය මූණ සෝදා, දත් මැද ඇඳුමක් ඇඳලා උයනට ගියා, සිංදු කියන්න. එයා ඉතිං සින්දු කිව්වා. එතකොටම සේවිකාව ඇවිල්ලා ඇයට කිව්වා උදේ කෑම කන්න එන්න කුමරියනි කියලා. ඉතින් ඒ කුමරිය උදේ කෑම කන්න ගියා.

ඇය උදේ කෑම කන්න කෑම මේසේ වාඩි වුණා. ඇයගේ අම්මා සහ තාත්තා කෑම මේසේ වාඩිවී සිටියා. තුන්දෙනාම සතුටින් උදේ කෑම කෑවා. ඇනාලා කුමරිය කෑම කාලා ඉවර වෙලා නැවතත් උයනට සිංදු කියන්න ගියා

මේ පාර ඇය පොතකුත් අරන්මයි ආවේ. ඇය නැවතත් සිංදු කියන්නට පටන් ගත්තා. ටික වේලාවකට පස්සේ ඇය සින්දු ගැයීම නතර කරලා පොත කියවන්න පටන් ගත්තා. ඇය උයනේ වෙන පැත්තකට පොත කියවන්න ගියා.

එතකොට එයා බිත්තියේ වැදුනා. එයා හැරිලා බලන කොට රෝස පාට දොරටුවක් තිබුණා.

# මායා දොරටුව



ඇනාලා කුමරිය ඒ දොර ඇරලා බැලුවා. ඇයගේ අතේ තිබුණු පොත බිම වැටුනා. ඇය ඇතුළට ගිහිල්ලා මායා දොරටුව වැහුවා.

ඇය ඇතුලේ ඉඳන් "කවුරු හරි ඉන්නව ද?" කියලා ඇහුවා. ඇය තවත් ඉස්සරහට ගියා. එයා දැක්කා ලස්සනම ලස්සන එයා කවදාකවත් දැකලා නැති ලොකුම ලොකු මල් තියෙන උයනක්. එයාගේ ඇඳුමත් වෙනස් වෙලා තිබුණා. ඇයගේ කහ පාට ගවුම ලස්සන රෝස පාට ගවුමක් වෙලා. ඒ වාගේම එයාට අත්තටු ඇවිල්ලා තිබුණා.

එයාට ඒ වාගේම සුරංගනාවියන් දෙදෙනෙක් හම්බ වුණා. ඒ දෙන්නාට ඇයට වගේ අත්තටු තිබුණට ඒගොල්ලොන්ට මායා බලයත් තිබුනා.

ඒගොල්ලෝ කුමරියට එයාලගේ නම් කිව්වා. ඇනාලා කුමරියගේ කොණ්ඩේ පාටම කොණ්ඩයක් තියෙන සුරංගනාවියගේ නම 'රෝස් මලී'. දුඹුරු පාට කොණ්ඩේ තියෙන සුරංගනාවිය 'නිල්මලී'.



ඒ දෙන්නා ඇනාලා කුමරියවත් අරගෙන උයන උඩින් පියාඹලා අඳුරු ඝන කැලෑවක් මැදින් ගොස් ආයෙත් ලස්සන උයනකට ආවා. ඒ උයනේ හිටියේ සුරංගනාවියන් පස්දෙනෙක් විතරයි. කුමරිය ඒ ගොල්ලොන්ගෙන් ඇහුවා ''ඇයි සුරංගනාවියෝ පස් දෙනෙක් විතරක්'' කියලා.

රෝස් මලී කුමරියට කිව්වා ''ඒ උයනට එන්න කලින් තිබූ අඳුරු ඝන කැලෑවේ මායාකාරියක් හිටියා කියලා. ඒ මායාකාරිය තමන්ගේ බලය වැඩි කර ගැනීමට සුරංගනාවියන්ගේ යෂ්ටි පැහැර ගත්ත නිසා ඒ සුරංගනාවියන් තමන්ගේ බලය නැතුව ඒ ඒ තැන්වල ගල්ගැහුණා'' කියලා.

''අලුත් කුමරියක් ආවොත් ඒ කුමරිය ඔවුන්ව බේරා ගන්න බවත් ඒ කුමරිය ඇනාලා කුමරිය කියලා''ත් රෝස්මලී කිව්වා.

නිල් මලී උඩ බලලා කෑ ගැහුවා. ඒත් එක්කම කවුද කෑගහලා හිනා වුණා.

# මායාකාරිය



ඒ ආවේ හරිම කැත, කොස්සක් උඩ නැගලා පියාඹන ගැහැණු කෙනෙක්. ඒ තමා මායාකාරිය.

එයාට හරිම නපුරු මුහුණක් තිබුණා. එයා ඇනාලා, රෝස් මලී සහ නිල්මලීගේ පිටිපස්සෙන් පැන්නුවා. වෙලාවට රොස් මලී එයාලාව යට ගුහාවකට ඇද ගත්තා. එයා කිව්වා මායාකාරිය ඇනාලා කුමරියව විනාශ කරයි කියලා. ඇය කුමරියට මිදි දාපු කේක් කන්න දීලා මායාකාරියගේ සටන ගැන කිව්වා.

''ඒක මායා සටනක්. හැබැයි ඇනාලා කුමරිය පැරදුනොත් අපි ඔක්කොටම පිළිම වෙන්න සිද්ධ වෙයි''. නිල්මලී කිව්වා. රෝස්මලී ඇනාලා කුමරියට ලස්සන රෝස පාට යෂ්ටියක් දුන්නා.

ඔයත් එක්ක අපි දෙන්නත් එනවා. හිත ධෛර්ය කරගෙන මායාකාරිය පරද්දන්න. ඇනාලා කුමරිය එයාගේ අසරණ යාලුවන් බේරා ගන්න මායාකාරිය ගාවට ගියා සටන ආරම්භ කරන්න. මායාකාරිය සටනට කැමති වුණා.

ඉතිං කුමරිය මායාකාරිය සමඟ සටනට ආවා. මුලදී මායාකාරිය කුමරියගෙන් බලය ගන්න හැදුවා. ඒ උනාට හරි ගියේ නෑ.

ඇනාලා කුමරිය දැන් මායාකාරිය පරද්දන්න ඔන්න මෙන්න ඉන්නේ.

මායාකාරිය එක එක මන්තර ජප කරනවා. ඒත් ඇනලා කුමරියව එයාට පරද්දන්න දැන් බෑ. ඇනාලා කුමරිය ධෛර්යය අත් නොහැර ටිකෙන් ටික මායාකාරියව පස්සට යවනවා.

# පරාජය



ඔන්න ඔහොම මායාකාරියව පරාජ කරන්න යද්දි මායාකාරිය සුළි සුළඟක් හදලා ඇනාලා කුමරියව මරන්න හැදුවා. ඒත් ඇනාලා කුමරිය ඒකෙන් මැරුණේ නෑ. ඇය හිත ධෛර්යය කරගෙන මායාකාරියව පස්සට යවනවා. ආයෙත් අර සුළි සුළඟක් ඇනාලා කුමරියව මරන්නට හැදුවා. ඒත් හරි ගියේ නෑ. එතකොටම මුළු ප්‍රදේශය ම අඳුරු වුණා. ඒ සමගම දඩාස් ගාලා සද්දයක් ඇහුණා. මායාකාරිය කෑගැහුවා.

මායාකාරිය එක එක මන්තර ජප කරනවා. ඒත් ඇනාලා කුමරියව පරද්දන්න එයාට දැන් බෑ. ඇනාලා කුමරිය ධෛර්ය අත් නොහැර ටිකෙන් ටික මායාකාරියව පස්සට යවනවා.

රෝස්මලී මායාකාරියගේ යෂ්ටියට ඊතලයකින් විද්දා. මායාකාරිය ඉක්මනින් වෙනත් යෂ්ටියක් අරගෙන හැමෝම ගල් කලා.

ඇනාලා කුමරිය හැමෝම එයාගේ මයා බලයෙන් යථාතත්වයට පත් කළා. ඇනාලා කුමරිය ලොකුම ලොකු රෝස පාට මායා බෝලයක් හැදුවා. හදලා ඒ බෝලය මායාකාරිය දෙසට විසි කළා.

මයාකාරිය, එපෝ! කියාගෙන මාලිගාව කඩාගෙන තරුවක් දිහාට විසි වුණා. ගල් වී සිටි සුරංගනාවියන් යථා තත්ත්වයට පත් වී ඇනාලා කුමරියට හිස නැමුවා. ''ඔයා තමයි අද සිට අපේ රැජින'' කියලා කිව්වා.

ඒත් සමගම මව් රැජිණ ඇනාලා කුමරිය සෙව්වා. ''ඇනාලා එන්න පැටියෝ'' කියලා කතා කළා. ''අම්මා මාව හොයනවා. මම ඔයගොල්ලන්ව අමතක කරන්නේ නෑ'' කියලා නික්ම ගියා.

ඇනාලා කුමරිය පිටිපස්ස හැරිලා බැලුවා. මායා දොර ආපසු බිත්තියක් බවට පත්වුනා. ඇනාලා කුමරියගේ මව කුමරියගේ ඇඳුම් දැක පුදුමයට පත්වුණා. කුමරිය මුළු විස්තරයම මවට කිව්වා.

''ඇනාලා, ඒක තමයි උත්සාහ කලොත් සියල්ල ජය ගත හැකියි. කියලා කියන්නේ'' ඇනාලාගේ මව පැවසූවා.ඉන්පසු කුමරියයි රැපිණයි මාලිගාවට ගොස් සතුටින් ජීවත්වුණා.

නිමි

# පසුවදන



රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර සනුලි රණසිංහ දියණියනි ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්

ISBN - 978-624-208-625-5